සඳකඩ පහණක කැටයම් ඔපලා
පාවෙන දේදුණු ලැගුම් ගනී
කැළැතුණ රසයක පැන ආ බුබුලක්
අකුරු වැලක් දෙහදක ලියැවේ
යුගයෙන් යුගයට නොමියන දහනක
දිවියක පදනම මතුවෙද්දී
නොපෙනෙන ඈතක ඈ ගෙන යනවා
සියුමැලි කැකුලක් මැලැවෙද්දී //

දහසක් පෙතිමත රහසක් කොඳුරා
තුඩින් තුඩට ගෙන යන බින්දු
ගව්වක් ඉහළට ගොනු කොට රඳවා
පොපියන දෙතොලක් එහි රැන්දු
අහසක් ගුගුරා කලුවක් වපුරා
ඒ හා මුහුවුණ වැහි බින්දු
ඈ ගෙන යද්දී නටබුන් අතරක
තවෙතෙක් ඈ වෙත හද රැන්දු //

හද විල ඉපැදුණ කැකුලක් නොකලෙක
නටුවෙන් ගලවා දුරක යවා
මිහිලිය තෙත් කොට ගිළිහුණ කඳුලත්
සත් සමුදුරකට මුහුව ගියා
ඔබට උරුම වූ රිදුණ තැවුණ හද
එක්ටැම් මැදුරක කවුළු අරා
රුවන් විමානෙන් පියඹා එනතුරු
පොපියන හදවත සිටී බලා.... //




සිසිර දිසානායක

# සඳකඩ පහණක ඔපලු කැටයම්



සිංහල ගී වංශ කතාවේ එකම සිවු කුළුඳුල් ගීය වීමේ වරම් ලද ගීයේ පුරාවත ලේඛණගත කරන්නට මෙවර 'ගී සඳළුව' වරම් ලබනවා. මෙලෙස විරල නැකතකින් උපන් මේ ගීය ''සඳකඩ පහණක කැටයම් ඔපලා'' ගීයයි. මුල් පදය කිව් සැණින්ම අප කවුරුත් හඳුනා ගන්නා මෙම ගීය ගැයූ ශිල්පියා පිළිබඳවද සිහිපත් කිරීමට ආයාසයක් ගත යුතු නෑ. ''සඳකඩ පහණින්'' උපන් හැඩ කැටයම්කරුවා නම් ශිල්පී සුනිල් එදිරිසිංහයි. සිය මුල්ම චිත්‍රපට අධ්‍යක්ෂණය කරමින් 'මාතර ආච්චි' චිත්‍රපටයෙන් දොරට වැඩි අධ්‍යක්ෂකවරයා, සුනිලුන්ගේ දෙටු සොයුරු සතිස්චන්ද්‍ර එදිරිසිංහයි. චිත්‍රපටයේ තේමාව වචනයට ගොනු කරමින් ඒ වදන් අතරින් පිළිපන් ගේය පද රචකයා, ප්‍රවීන රංගන හා හඬ කැවීම් ශිල්පී වොලි නානායක්කාරයි.

මෙම ගීය ඔහුගේ ප්‍රථම මෙන්ම අවසන් පද රචනයද වූවා. තම සවර නිර්මාණ දිවියේ මුල් ම වරට චිත්‍රපටයක් සඳහා සංගීත අධ්‍යක්ෂණය කළ වික්ටර් රත්නායක සංගීතවේදියාණන් මෙම මියුරු ගීය සඳහා තනුවත් සංගීතයත් නිර්මාණය කළා.

ප්‍රවීණ ශිල්පී සුනිල් එදිරිසිංහ සමග මෙම ගීයේ පුරාවත පිළිබඳව දොඩමලු වන්නට ඉසිමුවක් ලබා ගත්තේ ගී සඳළුව පාඨක ඔබ වෙනුවෙන්.

''ලේසි වුණේ නෑ වැඩේ....ං '
සුනිල් සිය මියුරු හඬ අවදි කළා. ''ඇයි සිසිර, කෙළින්ම රෙකෝඩින් එක කරනවානේ. දැන් වාගේ නෙවෙයි. සියලුම වාද්‍ය භාණ්ඩත් ඒ එක්කම රෙකෝඩින් එකට ගන්නවා. එක් කෙනෙක් වැරැද්දුවොත් ආයෙත් ඔක්කොම මුල ඉඳලා ගන්න වෙනවා. මගෙ මතකයේ හැටියට දාසය වතාවක් විතර ආය ආය කරන්න වුණා. එක වයලීනයක බෝ පාරක් එහා මෙහා වුණාත් වික්ටර් අයියා සතුටු නෑනේ ං''

වික්ටර් රත්නායකයන් ව ''වික්ටර් අයියා'' නමිනුයි සුනිල් හඳුන්වන්නේ.

''පටිගත කරපු අයටත් සෑහෙන්න වැඩ තියෙන්න ඇති?''

''අනේ ඔව් ං කැළණියේ සරසවි ශබ්දාගාරයේ දී මර්වින් රුද්‍රිගු තමයි පටිගත කළේ. මේ වාගෙ වැඩවලදී පුදුම කැපවීමක් තියෙන්න ඕන. ඒ අතින් මර්වින් විතරක් නෙවෙයි, එතන වාදනයට හවුල් වුණ විශාරද විජේරත්න රණතුංග, රොක්සාමි, එඩිගා පෙරේරා, මර්වින් පෙරේරා, එන්.ඩබ්. පීරිස්, වයි.එම්. සුමනසිරි වගේ අයත් හරි උනන්දුවෙන් කළ වැඩක් මේක. මේ වගේ ප්‍රවීන පිරිසක් එක්ක ආධුනික මගෙන් උපරිම දේ ලබා ගන්න සෑහෙන්න වෙහෙසෙන්න වුණා.''

''අනික ඒ වෙලාවේ එතන එකතු වෙලා හිටිය රෝහණ වීරසිංහ, ලක්ෂ්මන් විජේසේකර, ආනන්ද වීරසිරි, බන්දුල විජේවීර, පුණ්‍යසිරි මහවත්ත, සේන වීරසෙ-'කර වගේ අයගෙන් මට පුදුම හයියක් ලැබුණේ. ඇත්තටම අයියාත් එතන හිටියානේ....''

''එදා ඒ අය ගායකයෝ, සංගීත ශිල්පියෝ වෙලා ඉන්න නැතිව ඇති නේද?'

''ඔව් මං හිතන්නේ. හැබැයි සේනලා, පුණ්‍යසිරිලා, ඒ වෙනකොටත් ගීත රචකයෝ වෙලයි හිටියේ.'' සුනිල් සිනහ මුවින් පිළිසඳර නිමා කළා.

සඳකඩ පහණ යනු සිංහල ගල් කැටයම් කලාවේ අපූර්වත්වය සහ සියුම් බව උපරිමයෙන්ම කියා පානා එක් විශ්මිත නිර්මාණයක්. එවන් සියුම් කැටයමක් දේදුන්නක එළියෙන් ඔපවත් වූ කල කෙතරම් චමත්කාරදැයි සිතා ගත හැකිද? එලෙස ඔපලමින් අහසේ පාවී යන දේදුනු එක තැනක ලැගුම් ගනී. කැලතුන රස දහරකින් පැන නැගුණ බුබුලක්, අකුරු වැලක් සේ දෙහදක ලියැවෙන්නේය.

එක්තරා යුගයක රජ දහනක් සේ ගෙවුණ ප්‍රේම අතීතයේ අත්තිවාරම් නටඹුන් සේ මතු වෙද්දී, ඇයව ඒ පරිසරයෙන් මුදවා ඈතක ගෙන යන්නේ සියුමැලි ළාබාල ඇය මැලවී යද්දීය. අතීත ආදර පුරාවත හෙළිවද්දී තරුණ ඇය ඔහුගෙන් ඉවත් කරනා බවකි කියැවෙන්-න්.

දහසක් මල් පෙති මත කොඳුරමින් තුඩින් තුඩට ගෙන යන බින්දු නම් මල් රොන් බිඳු නොවන්නේද? ගව් ගණනක් ඉහළට එක්කර රැඳවූ පොපියන දෙතොලකින් කියැවෙන්නේ ආදරයක් අයැදීම නොවේද? තුඩක පහස පතන මල්පෙති සේය ඒ තොල්පෙති. අහස ගුගුරා වැහි වලාවකින් කලුවරව එයට මුහු වුණ වැහි බින්දු ඉහතින් කී ප්‍රේම නටබුන් අතරින් ඇය ගෙන යද්දී ඇයගෙන් ගිලිහුණ කඳුලු බිඳු වැනිය. අඳුරු අහස කුරිරු වටපිටාවත්, අහසේ ගිගිරීම තර්ජන - ගර්ජනත් මවා පායි. ඒ අතරේ තවත් කෙනෙක් ඇය වෙත හද රන්දයි. ඇයව බලාපොරොත්තු වෙයි.

හදවත නමැති විලෙහි ඉපැදුන මල් කැකුලක් අකාලයේ නටුවෙන් ගලවා දුරකට යැවීමෙන් නෙතක උපන් කඳුලක් පොලෝ තලය තෙත් කර සත් සමුදුරකට මුහු වී ගියේය. මල් කැකුලකින් නැවතත් හැඟවෙන්නේ සිතෙහි මෝදු වී ගෙන ආ ආදරයම නොවේද? ඒ ආදරය මුලිනුපුටා ඉවත් කිරීමෙන් ඇයට උරුම වූයේ රිදුණ, තැවුණ හදක් පමණකි. ඒ සිත එක් ටැම් මැදුරක සිරගත වී ඇත්තා සේය. සිරගතව සිටියද තවමත් පොපියන සිත එක්ටැම් මැදුරේ විවර වූ කවුලුව අරාගෙන බලා සිටින්නේය. මුළු චිත්‍රපටයක තේමාව සිය පෑන් තුඩගින් විනාඩි කීපයකට වොලී නානායක්කාරයන් ගොනු කළ අන්දමයි ඒ.

නැවුම් මිහිරි කටහඬක් රසික මනැසේ නොමැකෙන සේ කැටයම් කරන්නට තරම් උපරිම රසයක් මැවූ අති විශිෂ්ඨ තනුවකි මේ පද පෙළ නලවන්නේ. එම තනුව රසෝතියක හොවන්නට පෙළ ගැසුනා වූ වයලීන, බටනලා, ගිටාර, තබ්ලා සහ සිතාර් සරයෙන් අලංකෘත මියැසි ලියකමින් හැඩ ගැන්වූයේ වික්ටර් රත්නායක ගාන්ධර්වයාණන්ම මිස අන් කවුරුන්ද? මේ සියලු කැටයම් ඔපලන දේදුනු කිරණය නම් සුනිලුන්ගේ ගැඹුරු මියුරු කට හඬ හා ගායනා ලතාවම නොවන්නේ ද?






# චන්ද්‍රයා - (සඳු)

චන්ද්‍රයා ලෝකයේ මව් වේ එසේම රෑ උපදින්නන්ට ද මව් වේ. ස්ථිරත්වයට සූර්යයා මෙන්ම චංචලත්වයට චන්ද්‍රයා බලවත් වේ. චන්ද්‍රයා පෘථිවියට අයිති ග්‍රහයෙකි. පෘථිවි ප්‍රමාණයෙන් හතරෙන් පංගුවක් පමණය. බරෙන් අටෙන් පංගුවක් පමණ වේ. දුරින් සැතැප්ම 240000 පමණ වේ. තත්පර 1 1/2 කින් සඳරැස් පොළවට වැටේ. සූර්යයාට මෙන්ම පැයීමට සහ බැසීමට මිනිත්තු දෙකක් ගත වේ.

ලෝකයා අති පුරාණයේ සිට චන්ද්‍රයා දිව්‍ය මාතාව මෙන් පිළිගෙන එයි. පෘථිවියේ වාසය කරන්නා වූ සියලු සත්වයින්ගේ ද ගස්කොළන් වලට පමණක් නොව ගල් ජලය ආදින්ගේ ද වෙනස් වීම චන්ද්‍රයා නිසාම වේ. මනුෂ්‍යාගේ සිතට අධිපතිය. ජීවිතය කල්පවත්වාගෙන යාම ද නොයාම ද රෝග වැලක්වීම ද චන්ද්‍රයා අනුව සිදු වේ. ශරීරයේ තෙත ගතියට හෙවත් සෙමට අධිපති වේ. චන්ද්‍රයා උච්ච වූ විට රූපවත් බව හා යහපත් හිත ඇති වීමට හේතු වේ. විශේෂයෙන්ම චන්ද්‍රයා උච්ච වීම ස්ත්‍රී කේන්ද්‍රයක උසස්ම පිහිටීමකි. පුරුෂයන්ගේ සූර්යයා උච්ච වීමද එසේම වේ. දරු උත්පත්තිය කුස පිළිසිඳ වීම ඔසප් වීම චන්ද්‍රයා අනුව වේ. චන්ද්‍රයා දිනපතා අඩු වැඩි වන බැවිනුත් ගමන ඉතා සීඝ්‍ර බැවිනුත් වෙනස් වන ගතිය ස්ථිරත්වයක නොසිටිය හැකි ගතිය හිතේ බය, පරිහානිය, චන්ද්‍රයාගෙන් වෙයි. උසස් සිතුවිලි අනුව කරන දේට චන්ද්‍රයා බලවත් වූ පමණට යහපති.

ජ්‍යොතිශාස්ත්‍රය, වශී කරන ශාස්ත්‍රය අනුන්ගේ සිතිවිලි කියවීමේ ශාස්ත්‍රය ආදිය චන්ද්‍රයා කටකයේ සිටින්නන්ට එතරම් අරුම නොවේ. පුර චන්ද්‍රයා සියලු යහපත දෙන ශුබයකු සේම අවචන්ද්‍රයා සියලු අයහපත දෙන අශුබයකි. පුර චන්ද්‍රයා ශරීරයේ පිරිසිදු රත්ක ධාවන නාඩි වලටත් අවචන්ද්‍රයා අපිරිසිදු ලේ ගමන් කරන නාඩි වලටත් අධිපතිවෙයි. පිරිමින්ගේ වම් ඇස ද ස්ත්‍රීන්ගේ දකුණු ඇසද වේ. ගව වැඩට, යුෂ සහිත පලතුරු ව්‍යාපාර ඇරඹීමට යාම, සුබ ගමන් යාමට, චන්ද්‍රයා බලවත් වූ විට යහපත් වෙයි. චන්ද්‍රයා දුර්වල අවස්ථාවේ උපන් මනුෂ්‍යා බාල කාලයේ හා මහලු කාලයේ රෝගි කෙනෙක් වෙයි.

මනුෂ්‍ය ශරීරයේ උගුර හා සෙම් නාලය, ආමාෂය ගර්භාෂය, මුත්‍රාශය ස්ත්‍රීන්ගේ පයෝධර, හා සියුම් අංග චන්ද්‍රයාට අයිති වේ. චන්ද්‍රයා නරක් වීමෙන් බොහෝ රෝග සෑදේ. අපස්මාරය, බෙල්ල මහත් වීම, පක්ෂගාතය, කෘශ රෝග, සරම්ප, පණු රෝග, වලිප්පු, සන්ධි රෝග, ග්‍රහනි රෝග පාචන රෝග, බඩේ දරුණු කැක්කුම්, ඇදුම, පපුවේ හතිය, උදර රෝග ලේ නහර මතු වීම පෙනහැල්ලේ රෝග උගුරේ රෝග, ගෙඩි දද, මානසික රෝග, සිහිය අඩු වීම, ස්ත්‍රීන්ගේ සුද්ධ වීමේ රෝග, ඇස් රෝග, බඩවැල් කැක්කුම ඇපැන්ඩිසයිටීස් වකුගඩු රෝගාදිය වැළඳේ. චන්ද්‍රයා නීච වූ කල හිත පිරිසිදු නොවේ.

ජ්‍යොතීර්‍ය විද්‍යාවේදී
ගත් කතුවර
**විජයසිරි විද්‍යාරත්න**